**ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**නිවාඩු කාලීන පාසල-2020 මාර්තු/අප්‍රේල්**

**ඉතිහාසය**

**07ශ්‍රේණිය__ප්‍රශ්නපත්‍ර 03**

- ❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වල හිස්තැන් වලට ගැළපෙන පිළිතුරු දී ඇති පිළිතුරු අතුරින් තෝරා ලියන්න.

1) අතීත ජනතාව සිය ආහාර නිෂ්පාදන අභියෝගය ජයගැනීම සඳහා .......................... ප්‍රධාන ජීවන වෘත්තිය ලෙස තෝරාගත්හ.

2) අතීතයේ පැවැති හේන් උම්මග්ග ජාතකයේ හඳුන්වා ඇත්තේ ............................ යනුවෙනි.

3) තෝනිගල සෙල්ලිපියේ............................. යනුවෙන් යල කන්නය හඳුන්වා ඇත.

4) පැරණි සමාජයේ කිරි ලබා ගැනීම සඳහා යොදාගත් ගවදෙනුන් නම්කර ඇත්තේ ..................................ලෙසිනි.

5).අතීතයේ .................................. නම් රන් කරුවන් විසින් මාල, වළලු, කරාබු, හිස පළඳනා ආදිය නිපදවා ඇත.

(පිටබිම්/මදහස/කෘෂිකර්මාන්තය/පිටදඩහස/සේන්/කර්මාන්ත/කිරිගෙරි/ස්වර්ණකාර/දී කිරි/තඹකර)

අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වලට අදාළ වඩාත් නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

6) අනුරාධපුර යුගයේ දී වැඩි කාලයක් පාලන බලය දරන ලද්දේ කුමන රජ පෙළපතට අයත් රජවරුන්ද?

i. ලම්බ කර්ණ හා කාලිංග රජ පෙළපත.

ii. ලම්බ කර්ණ හා මෞර්ය රජ පෙළපත.

iii. මෞර්ය හා චෝල රජ පෙළපත.

iv. මෞර්ය හා කාලිංග රජ පෙළපත.

7) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ නම් පාණ්ඩ්‍ය රජු මෙරට ආක්‍රමණය කරන විට මෙහි සිටි පාලකයා කවුද?

i.දෙවන දප්පුල රජු                ii. V වන මිහිඳු රජු

iii. I වන සේන රජු                iv.දෙවන කස්සප රජු

8) රාජ්‍ය පාලන කටයුතු වලදී රජුට සහය වූ නිලධාරි පිරිසක් වූ "අග අදෙක" යනුවෙන් හඳුන්වන ලද්දේ කව්රුන්ද?

i. ඇතුන් පිළිබඳ කාර්යාංශයේ ප්‍රධනියා

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

ii. ලේඛන කටයුතු භාර ප්‍රධානියා.

iii. අනාගත රජකම උරුම තැනැත්තා.

iv. අශ්වයන් පිළිබඳ කාර්යාංශයේ ප්‍රධානියා.

9) අනුරාධපුර යුගයේ මෙරට පැවැති නීති රීති පිළිබඳව සඳහන් වන සෙල්ලිපිය කුමක්ද?

i. වේවැල්කැටිය සෙල්ලිපිය

Ii. මිහින්තලා පුවරු ලිපිය.

Iii. අඹගමුව ශිලා ලිපිය

iv. දෙවනගල සෙල්ලිපිය.

10) බුරුම රටින් භික්ෂූන් වැඩමවා මෙරට උපසම්පදාව යළි පිහිට වූ රජතුමා කව්ද?

i. මහා පරාක්‍රමබාහු රජතුමා.

ii. මහා විජයබාහු රජතුමා.

iii. නිශ්ශංකමල්ල රජතුමා.

iv. දුටුගැමුණු රජතුමා.

අංක 11 සිට 15 දක්වා දී ඇති වාක්‍ය හරිනම් √ ලකුණද වැරදි නම් x ලකුණ ද හිස්තැන මත යොදන්න.

11) පොළොන්නරුවේ කිරි වෙහෙර I වෙනි පරාක්‍රමබාහු රජු විසින් කරවන ලද්දකි. (................)

12).කොලඹ නගරය පැරණි ලෝක උරුම නගරයක් ලෙස පිළිගෙන තිබේ. (................)

13).ලෝක ප්‍රසිද්ධියට පත්ව තිබෙන සීගිරි සිතුවම් වසර 1500 ක් තරම් පැරණිය. (................)

14).අනුරාධපුර නගරයෙහි පිහිටා ඇති විශිෂ්ට කලා නිර්මාණයක් වන්නේ නිශ්ශංකලතා මණ්ඩපයයි. (................)

15).ගාලු කොටුව ගොඩනඟන ලද්දේ ලන්දේසින් විසිනි. (................)

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

අංක 16 සිට 20 සඳහා A කොටසෙහි දක්වා ඇති වගන්තිවලට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න.

| A | B |
|---|---|
| 16) .චන්ද්‍රභානු පරාජය කිරිම.(......) | I.ග්‍රීක ශිෂ්ටාචාරය |
| 17).ජෝතිය සිටාණන්ගේ කැරැල්ල මැඩලීම (......) | ii.දෙවනපරාක්‍රමබාහු රජතුමා |
| 18).ඇතැන්ස් සහ ස්පාටා (.........) | iii. සීගිරිය |
| 19).රෝම නීතිය (.........) | iv.හයවන පරාක්‍රමබාහු රජු |
| 20) ජල මල් (..........) | v.රෝම ශිෂ්ටාචාරය |

(ලකුණු 20)

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

## i i කොටස

❖ **ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

1) අතීතයේ අපේ රටේ ජීවත් වූ ජනතාව ජීවනෝපාය සඳහා විවිධ වෘත්තීන්වල නියලුණහ. ඔවුන් විවිධ අභියෝග වලට මුහුණ දෙමින් සිය අනන්‍යතාවය ගොඩනඟා ගත්හ.

i. අතීත ජනතාවගේ ජීවන රටාව සිදු වූ ප්‍රධාන ක්ෂේත්‍ර 3 නම් කරන්න. (ලකුණු 3)

ii. අතීත ගොවියා හේන් වගා කළ ආකාර 2 ක් ලියන්න. (ලකුණු 3)

iii. (a) වී ගොවිතැන සඳහා ජලය සපයා ගත් ආකාර දෙකක් ලියන්න.

(b).අතීතයේ සත්ව පාලනය යටතේ ගවයින්, කුකුළන්, එළුවන් ඇති කිරිමේ කාර්යයන් 3 ක් ලියන්න. (ලකුණු 5)

02) අතීත ජනතාව කෘෂිකර්මාන්තයට අමතරව කර්මාන්ත, වෙළඳාම ආදී වෙනත් වෘත්තීන් වලද නියුක්ත විය. ඒ සඳහා ඔවුහු විවිධ තාක්ෂණික ක්‍රම ද භාවිතා කළහ.

(i) අතීත සමාජයේ පැවැති කර්මාන්ත 3 ක් ලියන්න. (ලකුණු 3)

(ii) A. වළං සාදන්නන් B. රෙදි වියන්නන් C. මැණික් කපන්නන් D. යකඩ වැඩ කරන්නන්

පැරණි සමාජයේ හැඳින් වූ නම් පිළිවෙලින් ලියන්න. (ලකුණු 4)

(iii) (a) අතීතයේ වෙළඳාම සිදු වූ ප්‍රධාන කේෂත්‍ර 2 ක් නම් කරන්න.

(b) අතීතයේ ශ්‍රී ලංකාව වෙළඳ සම්බන්ධතා පැවැත් වූ විදෙස් රටවල් 3 ක් ලියන්න.
(ලකුණු 5)

03) අනුරාධපුර, පොළොන්නරු රාජධානි සමයේ අප රටේ යහපත වෙනුවෙන් විශාල කැපවීමකින් කටයුතු කළ රජවරු කීපදෙනෙක් සිටියහ. ඔවුන්ගේ ශ්‍රේෂ්ඨත්වය සහ එයින් ලබාගත හැකි ආදර්ශ බොහෝය.


(i) අනුරාධපුර යුගයේ අප රට පාලනය කළ මානවම්ම රජ පෙළපතට අයත් රජවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 3)

(ii) අනුරාධපුර යුගයේ දී පැවැති රජකම උරුම වීමේ ක්‍රම දෙක ලියා එම ක්‍රම දෙකට උදාහරණ 02 ක් ලියන්න. (ලකුණු 4)

(iii) (a) මහා විජයබාහු රජතුමා පිළිබඳ හැදෑරීමට ඇති මූලාශ්‍ර 02 ක් ලියන්න.

(b) බුදු සසුනේ අභිවෘද්ධිය සඳහා මහා පරාක්‍රමබාහු රජතුමා සිදුකල සේවාවන් 03 ක් ලියන්න.
(ලකුණු 5)

04.



අපේ අතීත මුතුන්මිත්තන් විසින් ගොඩනගන ලද බොහෝ දෑ අතුරින් දැනට ඉතිරිව ඇති ඒවා අපේ ජාතික වස්තූන් ලෙස සැලකෙන අතර, ඒවා රටේ ජාතික උරුමයන් ලෙසද, ලෝක උරුමයන් ලෙසද සැලකේ. මේවා ආරක්ෂා කිරීම අප සතු යුතුකමකි.

(i) මෙම රූපයෙන් දැක්වෙන ස්ථානය නම් කරන්න. (ලකුණු 1)
(ii) මෙහි බලකොටුවක් නිර්මාණය කළ රජු කවිද? (ලකුණු 1)
(iii) මෙම ස්ථානයේ දැකිය හැකි සුවිශේෂි ලක්ෂණ 04 ක් නම් කරන්න.
(ලකුණු 4)
(iv) ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක උරුම ස්ථාන 02 ක් නම් කරන්න (ලකුණු 2)
(v) අපේ සංස්කෘතික උරුමයන් රැක ගැනීමේ වටිනාකම පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
(ලකුණු 4)

UVA P... EDUCATION

05. අනුරාධපුර, පොළොන්නරු පාලන මධ්‍යස්ථාන බිඳවැටීමෙන් පසු ලංකාවේ බිහිවූ පාලන මධ්‍යස්ථාන වෙනස්ම ස්වරූපයක් ගත්තේය. එහි සිටි ශ්‍රේෂ්ඨ පාලකයින්ගෙන් සිදු වූ සේවය උත්කෘෂ්ටය.

(i) පොළොන්නරු පාලන මධ්‍යස්ථානය බිඳ වැටීමෙන් පසු බිහිවූ පාලන මධ්‍යස්ථාන 03 ක් නම් කරන්න. (ලකුණු 3)

(ii) පහත දැක්වෙන පාලන මධ්‍යස්ථාන පිහිටුවා ගත් පාලකයින් දී ඇති පිළිතුරු අතරින් තෝරා පිළිවෙලින් ලියන්න.

A. මිනිපේ
B. යාපහුව
C. ගෝවින්ද මලය
D. දඹදෙණිය

(විජයබාහු/ සුභ සෙනෙවි/ බුවනෙකබාහු ආදිපාදි/ සංඛ සෙනෙවි) (ලකුණු 4)

(iii) දෙවන පරාක්‍රමබාහු රජුගෙන් සිදු වූ සේවය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.

(ලකුණු 5)

06. දඹදෙණි රාජධානියෙන් පසු පාලකයින් තම පාලන මධ්‍යස්ථාන වරින් වර වෙනස් කරන ලදී.වැඩි ආරක්ෂිත ස්ථාන ඔවුහු පාලන මධ්‍යස්ථාන ලෙස තෝරා ගත්හ.මෙම රාජධානි සමයන්හිදී රටේ ආර්ථික, දේශපාලන, සමාජ, සංස්කෘතික වශයෙන් සේවාවන් රැසක් සිදුවිය.

(i) පහත දී ඇති පාලන මධ්‍යස්ථාන වලට අදාල රජවරුන් දී ඇති පිළිතුරු අතරින් තෝරා ලියන්න.

A. යාපහුව
B. කුරුණෑගල
C. ගම්පොළ

(IV වන බුවනෙකබාහු/ VI වන පරාක්‍රමබාහු/ I වන බුවනෙකබාහු/ IV වන පරාක්‍රමබාහු/ III වන විජයබාහු) (ලකුණු 3)

(ii) පහත සඳහන් සිදුවීම් සම්බන්ධ පාලන මධ්‍යස්ථාන නම් කරන්න.

A. පාලි භාෂාවෙන් ලියා තිබූ පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම.
B. ඉබන් බතුතා නම් අරාබි ජාතික සංචාරකයා ලංකාවට පැමිණීම.
C. මිසරය සමඟ වෙළඳ සම්බන්ධතා පැවැත්වීම.
D. චන්ද්‍රභානු රජුගේ ආක්‍රමණය. (ලකුණු 4)

(iii) (A) - කෝට්ටේ යුගයේ ආරම්භ කරන ලද අධ්‍යාපන ආයතනයක් (B) - කෝට්ටේ යුගයේ බිහිවූ උගත් පඬිවරු දෙදෙනෙක් (C) - කෝට්ටේ යුගයේ බිහිවූ විශිෂ්ට සාහිත්‍ය කෘති 02 නම් කරන්න.

(ලකුණු 5)

07. නූතන යුරෝපා ජන ජීවිතය හා ඉතිහාසය ගොඩනැගීමට මෙන්ම මිනිස් සංහතියේ ඉදිරි ගමනට ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලැබුනේ ප්‍රබල පිටිවහලකි.

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

(i) ග්‍රීසිය පාලනය කළ රජවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 3)

(ii) පැරණි ග්‍රීක ජනතාව,

A. වගා කල ධාන්‍ය වර්ගයක්
B. ඇති කල සත්ව වර්ගයක්
C. ආහාරයට ගත් දෙයක්
D. වෙළඳාම සඳහා යොදාගත් භාණ්ඩ වර්ගයක්

වරහන් තුළ දි ඇති පිළිතුරු අතුරින් තෝරා පිළිවෙලින් ලියන්න.

(සුවඳ විලවුන්/ බත්/ තිරිඟු/ තේ/ මස්/ බැටළුවන්/ වී/කුකුළන් )
(ලකුණු 4)

(iii) රෝම ශිෂ්ටාචාරයෙන් ලොවට උරුම වූ දායාද පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.
(ලකුණු 5)

UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION